334

RARE

# ශ්‍රී ලංකාවේ අපරාධ කෙරෙහි බලපාන හේතු සාධක පිළිබඳ සමාජවිද්‍යාත්මක අධ්‍යයනයක්

(රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරින් කරන ලද ස්වාධීන අධ්‍යයනයක්)

නදිරා සරෝජනී ජයතුංග

FGS / S / 2001 / 129 / R

334

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති දෑඅවුරුදු උපාධි පරීක්ෂණයේ අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම සඳහා කෙරෙන ස්වාධීන නිබන්ධිකාවකි.

කැලණිය විශ්වවිද්‍යාලය

2003

# සාරාංශය

මෙම අධ්‍යයනය ශ්‍රී ලංකා සමාජයේ වර්ධනය වෙමින් පවතින අපරාධකාරී ප්‍රවණතාව පිළිබඳ ව කරනු ලබන සමාජවිද්‍යාත්මක විමර්ශනයකි. ශ්‍රී ලංකාව පසුගිය දශක තුනක පමණ කාලයක් තිස්සේ ආර්ථික, සමාජීය, දේශපාලනික සහ සංස්කෘතික වශයෙන් අර්බුදකාරී සමාජ සන්දර්භයකට තල්ලු වී ගොස් ඇති බව පැහැදිලි කරුණකි. එසේම සමාජ සංස්ථා වශයෙන් ගත් විට පවුල, ආර්ථිකය, ආගම අධ්‍යාපනය, දේශපාලනය සහ නීතිය යන සංස්ථාවන්හි ද බිඳවැටීම් දක්නට ලැබේ. අපරාධ වනාහි මෙම සමාජ අර්බුදයේ ප්‍රකාශනයක් ලෙස සැලකිය හැකි ය. අපරාධ විද්‍යාඥයන් සහ සමාජ විද්‍යාඥයන් ඉදිරිපත් කර තිබෙන මතවාදවලට අනුව අපරාධ බරපතල සමාජ ව්‍යාධියක් වන අතර එය සමාජ දේහයේ හටගත් පිළිකාවක් බඳු දෙයකි. එබැවින් ශ්‍රී ලංකාවේ අපරාධ අතුරින් වඩාත් බරපතල අපරාධ ගණයෙහිලා අයත් වන මිනීමැරුම් සහ ස්ත්‍රී දූෂණ පිළිබඳ හේතුඵල සම්බන්ධතා අධ්‍යයනයක ප්‍රතිඵලයක් වශයෙන් මෙම නිබන්ධය සම්පාදනය කරනු ලැබේ. මෙම නිබන්ධයේ පළමු පරිච්ඡේදය අධ්‍යයනය පිළිබඳ හැඳින්වීම සඳහා යොමු වී තිබේ. තෝරාගත් ගැටළුවේ ඇති කාලීන වැදගත්කම, පර්යේෂණයේ අරමුණු සහ පරමාර්ථ එහි අන්තර්ගත වන අතර අධ්‍යයනයේ දී මුහුණ දුන් ගැටළු සහ සීමාකම්, දත්ත රැස් කිරීම සඳහා භාවිත කළ ක්‍රමවේදය මෙහි අන්තර්ගත ය. පොලිස්පතිගේ පාලන වාර්තා තුළින් ලබාගත් ද්විතීක මූලාශ්‍ර අනුව මූලික පර්යේෂණය (Basic Research) සිදු කරන ලද අතර ව්‍යවහාරික පර්යේෂණය සඳහා (Applied Research) තෝරා ගන්නා ලද්දේ රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයයි. සසම්භාවී නොවන අරමුණුගත නියැදියක් තෝරාගෙන සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය ඔස්සේ දත්ත දායකයන්ගෙන් තොරතුරු ලබාගන්නා ලදි. ස්ත්‍රී දූෂණ සහ මිනීමැරුම් සම්බන්ධව දත්ත දායකයන්ගෙන් තොරතුරු ලබා ගැනීමේ දී දැඩි දුෂ්කරතා සහ සීමාකම් ඇතත් හැකිතාක් දුරට ආනුභවික පර්යේෂණයක් ලෙස මෙය සිදු කිරීමට උත්සාහ ගතිමි.

මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ අපරාධ පිළිබඳ වාස්තවික ප්‍රවේශයක් සපයා ගැනීමට හැකි විය. එහි දී දුගී බව, සේවා වියුක්තිය, අවිධිමත් රැකියාවන්, නූගත්කම, බීමත්කම, පවුල් අර්බුද, ලිංගික ගැටළු වැනි සමාජ ගැටළු ගණනාවක සංයුක්ත ප්‍රකාශනයක් ලෙස අපරාධ සිදුවී ඇති බව හඳුනාගත හැකි විය. අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ දත්තවලින් මතුවන ප්‍රධාන කරුණක් නම් රත්නපුර ප්‍රදේශයේ මැණික් ආර්ථිකය සහ ඒ හා බැඳී තිබෙන උපසංස්කෘතිය අපරාධකාරී හැසිරීමෙහි ප්‍රධාන සංරචකයක් වී තිබෙන බවයි. තවත් වැදගත් කරුණක් නම් නීතිය සහ සාමය ආරක්ෂා කිරීමට ඇති පොලීසිය වැනි ආයතන

දේශපාලනීකරණයට භාජනය වීම නිසා අක්‍රීය තත්ත්වයකට පත් වී තිබීමයි. එබැවින් අපරාධ පාලනය සම්බන්ධ යාන්ත්‍රනය වඩා විධිමත් කළ යුතු බව මෙහිලා සඳහන් කළ හැකි ය.

සමස්තයක් ලෙස ශ්‍රී ලංකා සමාජය තුළ සමාජගත වෙමින් පවතින ප්‍රචණ්ඩත්වය අපරාධකාරී හැසිරීම කෙරෙහි ඍජු දායකත්වයක් පෙන්නුම් කරනු ලබයි. පසුගිය දශක දෙකක පමණ කාලයක සිට ශ්‍රී ලංකාවේ වර්ධනය වන අනෝමීයභාවය ප්‍රධාන ආකාර තුනකින් සමාජය කෙරෙහි අහිතකර ආකාරයෙන් බලපා ඇත. එනම්,

i. සාරධර්ම විරහිතභාවය පිළිබඳ අනෝමීයභාවය.

ii. ලිංගික ජීවිතය පිළිබඳ අනෝමීය භාවය.

iii. සියදිවි නසා ගැනීම පිළිබඳ අනෝමීය භාවය.

මේ ආකාරයන් තුනෙන් ම මිනිස් ජීවිතය පිළිබඳ වටිනාකම් පහත වැටෙන අතර අවිනිශ්චිතභාවය පිළිබඳ හැඟීම් වඩ වඩාත් උත්සන්න වෙමින් පවතී. අපරාධ සංස්කෘතියක් ලෙස ද (Culture of Crime) ගොඩ නැගෙන්නේ මෙවැනි පසුබිමක ය.

මිනීමැරුම් සහ ස්ත්‍රී දූෂණ යන අපරාධ වැඩි වශයෙන් සිදු වී තිබෙන්නේ දන්නා හඳුනන පුද්ගලයන් විසිනි. පවුල් මට්ටමේ ඥාති සබඳතා පලුදුවීම, සැකය, තරඟකාරී බව, ලිංගික ඊර්ෂ්‍යාව, අනියම් ලිංගික සබඳතා, බීමත්කම, ප්‍රේම සබඳතා, ආවේගකාරී හැසිරීම්, පලිගැනීම්, දිගුකාලීන වෛරය වැනි හේතු සාධක මත අපරාධ සිදු වී ඇති බව නිගමනය කළ හැකි ය. සමස්තයක් ලෙස ගත් කළ සමාජ අනුකලනය පලුදුවීම, ආගමික අනුකලනයෙන් සහ සාරධර්ම ස්ථාපිතභාවයෙන් අපගමනයවීම මෙන් ම පුද්ගල සබඳතාවන්හි වටිනාකම් පහළ වැටීම හේතු කොටගෙන සමාජ පාලනය පිළිබඳ මූලධර්ම උල්ලංඝනය වී ඇත. ඒ වෙනුවට සමාජ යුක්තිය කෙරෙහි අහිතකර ලෙස බලපාන මූල්‍යමය වටිනාකම්, දේශපාලනික බලඅධිකාරය සහ නීතිමය ආයතනික ව්‍යුහය අක්‍රියවීම යන හැඩ ගැසීම් මෙම අධ්‍යයනය මගින් හඳුනාගත හැකි විය.